

**අවුරුදු** වෙසක් සෙමින් ගෙවිලා ගිහින්. පොසොන් මසත් උදා වෙලා. කාලය අපට නොකියාම ගෙවිලා. අවුරුද්දෙන් බාගයක් විතර ඉවරයි. දැඩි සීතලක් අපට දැනුනට පොසොන් උදාවත් සමග අතීතයට යන අපේ සිතුවිලි නිසා සිත නම් ඉබේම උණුසුම් වෙනවා. වෙසක් හා පොසොන් දෙකම එකම අරමුනක් උදෙසා වෙන්වුන කාලයක් උනාට පොසොන් උත්සවයේ මූලික අරමුන අනුබුදු හිමියන් ගේ ලංකා ගමනය සිහිකිරීම නේ. ඉතිං ඒ වෙුනවෙන් අපි ලංකාවේදී කරන පෙරහැර ගැන මතක් වෙලයි සිත උනුසුම් උනේ. දැන් නම් අපි කුඩා කාලයේදී දැකපු සහභාගි වුන පෙරහැර මතකයක් පමනයි. දැන් පෙරහැරේ මූලික වන්නේ අලංකාරය විතරයි වගේ. සියල්ලම වානිජ කරනයට අහුවෙලා. අපේ ගමේ තිබූ මිහිඳු පෙරහැරේ අංග මට අද වගේ මතකයි. එහි බොහෝ සිත් ගන්නා අංගය වුනේ වැදි නැටුමයි. ලී කෙලි සෙල්ලම් කලගෙඩි නැටුම් මේ පෙරහැරට සූදානම් වෙන්න අපි ඒ දවස් වල හිටිය හැටි මතක් වෙනකොට හිනහත් යනව. අනේ ඉතිං දැං වගේ තාක්ෂන පහසුකම් නොතිබුනත් ඒ සහභාගිත්වයෙන් අපි ලැබුවේ අසීමිත සතුටක්. අපේ දෙමව්පියොත් අපට ඒ නිදහස උපරිමයට දීලා තිබුනා. මම මේ කියන අද්දැකීම් අපි හැමෝගෙම අද්දැකීම් තමයි. හැමදාම සුන්දර අතීතයනේ. මේ නැටුම් සිහිවෙන කොට තමයි මේ කාරනය මතක් උනේ. මේ ගැන ඔබත් නිකමට හිතා බලන්න.

අපි දැන් අවුරුද්දකට කී වතාවක් නම් විවිධ නර්තන ප්‍රසංග බලනවද? මෙහේ තිබෙන හැම ප්‍රසංගයකම නර්තන අංග අනිවාර්යයිනේ. ඒක හොඳ දෙයක්. අපේ දරුවන් විදේශයකට ඇවිත් තමන්ගේ හැකියාවන් දස්කම් ඉදිරිපත් කරන එක. ඒත් මේ ප්‍රසංග බලන ඔබට දැනුනේ නැද්ද අපේ නැටුම් කලාවේ පසුබෑමක් වගේ දෙයක්. මා අදහස් කලේ උඩරට නැටුම් පහතරට හා සබරගමු නැටුම් ගැනයි. බොහෝ උත්සව වල මේ අංග තියෙනව තමයි. ඒත් ඒ හැම අංගයක්ම භාරත නැටුම් කලාවට යටවෙලා කියලා ඔබට දැනෙන්නේ නැද්ද? හිතන්න. ඔබට මතක ඇති කාලෙක කිසිම ප්‍රසංගයක අපේ දරුවෙක් තනියම වේදිකාවේ උඩරට පහතරට හෝ සබරගමු නැටුමක් ඉදිරිපත් කල දිනයක් ගැන. ඒත් භාරත නැටුම් බොහෝ විට ඉදිරිපත් වෙන්නෙ තනි හා යුගල වශයෙන් නේද? ඇත්ත අපේ දරුවන් බොහෝ දක්ෂ විදිහට නටනවා. ඒ ගැන වාදයක් නැහැ. ඒත් හැම ප්‍රසංගයකම වාගේ ප්‍රධාන තැනක් ගන්නේ භරත නැටුම නේද? කොයිම මොහොතක වත් අපේ දරුවෙක් තනියම වේදිකාවේ ශ්‍රී ලාංකික නැටුමක් ඉදිරිපත් කරනවාද? හැම විටම දේශීය නැටුමක් ඉදිරිපත් කරනු ලබන්නේ විශාල කන්ඩායම් වශයෙන්. ඇයි අපේ දරුවන් ලවා අපේ නැටුමක් තනියම නටන්නට පුහුනු කරන්නට බැරි. අපට වන්නම් වලින් අඩුවක් තියෙනවද? දරුවන්ට දොස් කියලා වැඩක් නැහැ. ඒවා මෙහෙයවන අයයි ඒ ගැන හිතන්න ඕනෙ.

නටන එක නම් ලමයින්ට විතරක් නෙවෙයි අපටත් හොඳයි කියලා හිතෙන්නෙ මේ කාලෙට තමයි. දැං ගිම්හානය ගෙවිලා සරත් සෘතුවෙත් අගනේ අපි ඉන්නේ. බොහෝ අයට පොදු රෝගය මතු වෙන්න පටන් අරන්. ෆ්ලූ.. මේ ලෙඩ දැං ටික ටික අපේ ශරීර තුලින් මතුවෙන්න ගන්නේ අපේ වයසත් එක්ක කියන එක අපි පිලිගන්න ටිකක් මැලියි වගේ. මේ කාලයත් එක්ක ඇගේ අමාරු පිට කොන්දේ අමාරු දනිස් අමාරු හැමෝටම වගේ. මේ ලෙඩ රෝග අතරම අපි බොහෝ දෙනෙක් කියන පොදු කතාවකුත් මතක් උනා. ඔක්කොම ලෙඩ මේහේට ආවට පස්සෙ තමයි. ලංකාවේ ඉන්න කාලෙ කිසිම අමාරුවක් තිබුනේ නැහැ කියලා. ඕනෙ දේකට ඔරොත්තු දෙනවා කියලා. ඒත් ඉතිං ඒ සමගම අපේ යටි හිත දන්නවා මේ දෙකේ වෙනසේ ඇත්ත තත්වය. ලංකාවේදී අපි ලෙඩ තකන්නෙ නැහැ. අපි ලෙඩ ගැන දන්නෙ නැහැ. එ්ත් ඉතිං මෙහෙදි ලෙඩ අපට හොයාගන්න පුලුවන් පහසුකම් තියෙනව. ඒ නිසා අපි ෆ්ලූ එකටත් එන්නත් ගන්නවා කියලා. ඒව දැන දැනත් ඉතිං අර සංසාර පුරුද්දට වගේ ඕහේ කියනව. ඇත්තටම අපට මේහේදි මේ ලෙඩ ගති බොහෝම ඉක්මනට මතු වෙන්න හේතු කීපයක්ම තියෙනවා. මූලිකව හිතේ අසහනය. ඒකාකාරී වැඩ රටාව වගේ දේවල් අපි අපි මුන ගැහෙන බොහෝ වේලාවල් වලදී කතා කරන දේ වලින් මම නම් බොහෝ දේවල් තේරුම් අරන් ඉන්නෙ. ඇත්තටම ගත්තොත් හැම සැප සම්පතක්ම වගේ මෙහේ තිබුනත් අපි බානේ බැඳපු සත්තු වගේ තමයි. මෙහේදි අපට යමක් ගන්න නම් යමක් දිය යුතුමයි. නැත්නම් අපට නිකම් නම් කිසිම දෙයක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා අපි ඒ දේ ලබාගන්න අපේ දේ දෙනවා. හැම පැත්තකින්ම ඒ විදිහට වෙමින් මේක ඉදිරියටම යනවා. මෙහෙම කියන කොට මට මතක් උනේ ලගදී බලපු ටෙලි නාට්‍යයක්. නම සෙනෙහසේ ගීතය. බොහොම සරල කතාවක්. එදිනෙදා ජීවිතයේ සිදුවන සරල සිදුවීම් අතරින් අපට ජීවිතයේ යුතුකම් හා වගකීම් ගැන මනා වැටහීමක් ලබා දෙනවා. මම මේ ගැන ලියන්න හිතුවේ අපේ ජීවිතයේ වගකීම් හා අයිතිවාසිකම් මෙහේදි දැං අපි මුහුන දී සිටින වර්තමාන ජීවිතයට හොඳින්ම ගැලපෙන නිසයි. දැං අපි මෙහෙදි හොඳට වැඩ කරනවා. සෙක්කුවේ බැන්දා වගේ එහෙම කරන්න අපට වෙලා තියෙනවා. ඒත් අපි අපේ රටේදි මෙහෙම කලාද? අපි හුගක් වෙලාවට කියන දෙයක් තමයි අපි ලංකාවෙදි මේ විදිහට වැඩ කරා නම්, අවංක උනානම්, බිල් නියම වෙලාවට ගෙව්ව නම්, පෝලිමේ ගිහින් බඩු ගත්ත නම් , හොරකම් නොකල නම් අපේ රටත් ගොඩ තමයි කියල. ඇත්ත තමයි. අපි ලංකාවෙදි හැමදාම හිතුවෙ අපේ අපේ අයිතිවාසිකම් ගැන විතරමයි නේද? කවදාවත් අපේ යුතුකම් ගැන හිතුවද? කවුරුන් හෝ අපට අපේ යුතුකම් ගැන මතක් කලොත් අපි පිලිතුරු දුන්නෙ කොහොමද? ඇත්තටම මට නම් ඒ ගැන මතක් වෙන කොට ඇති වන්නේ බරපතල කනගාටුවක්. කන්තෝරුවේදි වෙලාවට වැඩට නොගිහින් ලොක්කා රතු ඉර ගැහුවොත් මූන කොරහක් කර ගත්ත අපි, දවසට තුන් හතර වතාවක් තේ බොන්න කැන්ටිමට ගිය අපි. කෑම පැයේ සාප්පු වන්දනාවේ ගිය අපි. වෙලාවට කලින් ඔෆිස් එකෙන් ගිය අපි, ලැබෙන පඩි මදියි කියලා වර්ජන පිකටින් කරපු අපි. දැං වැඩ පලක එකම ලයින් එකේ විවිධ ජාතියේ අයත් සමග, හිනාවෙන්න, මුහුන බලන්නවත් ඉස්පාසුවක් නැතිව මැෂින් වගේ වැඩ කරන හැටි දැක්කාම ඇතිවන්නේ දුකකට වඩා ආත්මානුකම්පාවක්. මේ වැඩ කරන විදිහට අප ලෙඩ වෙන්නෙ නැද්ද? මානසික අසහනයක් ඇති වෙන්නෙ නැද්ද? ඒත් ඉතිං අන්තිමට ලැබෙන ඩොලර් නිසා අමාරුවෙන් හරි සේරම දරාගෙන ඉන්නවා.

ජීවිතයේ හැටි ඔහොම තමයි. ගිය නුවන ඇතුන් ලවා වත් අද්දන්න බැහැ නේ. දැන් ජීවිත ඔරුව පෙරලුන පැත්ත හොඳයි කියා හිතාගෙන ඉන්න වෙනවා. මිය යනකම්. මරනය ගැන මතක් උන නිසා තවත් දෙයක් ලියන්නම්. මෙම ටෙලි නාට්‍යයේ මරනය හා ප්‍රියයන්ගෙන් වෙන්වීම ගැන අලුත් අදහසක් ඉදිරිපත් කරනවා. හිතන්න, ජීවිත කාලයක් ඔබ හා විසූ ඔබේ සහකරුවා හෝ සහකාරිය ඔබෙන් සදහටම සමුගත් දිනෙක ඔබ හැසිරෙන ආකාරය ගැන.ත ඇඩීම, දෙඩීම, වැලපීම යන දේ සාම්ප්‍රදායික දේවල්. ඒවා මැඩ පවත්වාගෙන ජීවිතයට මුහුන දිය යුතු බවයි මෙයින් ඉදිරිපත් කරන්නේ. එහි පියා මිය ගිය දින මව කඳුලු නොසැලීම ගැන දුව මවගෙන් ඇසූ විට ඇය පවසන්නේ පියා ජීවත්ව සිටින තාක් කල් තමන් ඔහුට ඉත.ා ආදරයෙන් සිටි බවත් තමන්ගෙන් විය යුතු සියලු යුතු කම් නොපිරිහෙලා තමන් ඉටු කල බැවින් තමා නොහැඬූ බවයි.

කාරනය ඇත්ත වුවත් ඒ ක්‍රමය අපට ටිකක් ගැලපෙන්නේ නැති ගතියක් තියෙනව වගේ. මොකද අපි තවමත් ඒ තරම් සංවර්ධනය වෙලා නැති නිසා. ඒත් විය යුත්තේ නම් ඒකම තමයි. වෙන්වීමට දුකට අසහනයට ධෛර්යයෙන් මුහුන දී ප්‍රශ්න විසඳා ගත හැකි නම් ජීවිතය ජයගන්න හැකියි. ටිකක් අමාරුයි තමටයි. අපට ඇති ප්‍රශ්න අමතක කරන්න මාසෙකට වතාවක් කොහේ හරි ගිහින් ගත කරලා එනවට වඩා දවසකට එක විනාඩි පහක් හෝ ඔබට එක තැනක නිසලව ඉඳ සිත එක්තැන් කරන්නට පුරුදු පුහුනු කරගන්නට හැකි නම් එයින් ලබාගත හැකි මානසික සහනය කියා නිම කරන්න බැහැ. මාද ඔබ මෙන්ම මේ සමාජයේ ජීවත් වන කෙනෙක් නිසා ඔබට පොදු ප්‍රශ්න මගේත් ප්‍රශ්නයි. ඇත්තටම මේ කතා කරන්නේ නම් පැහැදිලි අත්දැකීම් තුලින්මයි. ජීවිතයේ බොහෝ ප්‍රශ්න ගැන සැහැල්ලුවෙන් හිතන්න නිදහසේ හිතන්න, නිවැරදි තීරන ගන්න. මේ මානසික ඒකාග්‍රතාවය හරි වටිනවා. විනාඩි පහකින් පටන් ගන්න. අමාරු තමයි. කොයිදේත් අමාරු පටන් ගන්න තමයි. ඒත් නිවැරදිව කරනවා නම් යහපත් ප්‍රතිඵලත් අනිවාර්යයි. මේ උතුම් පොසොන් කාලයේදී ඔබගේ සිතට සැනසිලිදායක සිතිවිලි පහල වේවායි පතමි.

**සොයුරිය ධරණී**

## යමක වග්ග 13 සහ 14




යථා අගාරං දුච්චන්නං
වුට්ඨි සමති විජ්ත්‍රතී
ඒවං අභාවිතං චිත්තං
රාගෝ සමති විජ්ත්‍රතී

නිසිලෙස සෙවිලි නොකළ ගෙය
වැසි වසින විට තෙමේද,
භාවනාවෙහි නොවැ-ණු නුපුරුදු සිත
රාගයෙහි විනිවිදිනේය.

Yatha agaram ducchannam
vutthi samathi vijjhati
Evam abhavitam chittam
rago samathi vijjathi

Even as rain penetrates an ill-thatched house,
so does lust penetrates an undeveloped mind.

යථා අගාරං සුච්චන්නං
වුට්ඨි න සමති විජ්ත්‍රතී
ඒවං සුභාවිතං චිත්තං
රාගෝ න සමති විජ්ත්‍රතී

නිසි ලෙස සෙවිලි කළ ගෙය
වැසි වසින විට නොතෙමේද,
භාවනාවෙන් වැ-ණු පුරුදු කළ සිත
රාගය විනිවිද නොයේ.

Yatha agaram succhannam
vutthi na samathi vijjhati
Evam subhavitham chittam
rago na samathi vijjhati

Even as rain does not penetrates a well thatched house,
so does lust not penetrates a well developed mind.

## නිදානය

නන්ද තෙර ඇරඹ...
රජගහ නුවර වැඩවිසූ බුදුන් වහන්සේ පියරජ සුදොවුන් රජතුමාගේ ඇරයුමෙන්, පිරිවර ශ්‍රාවකයන් විසිදහසක් සමග කි"ල්වත් පුරයට වැ"සේක. එහිදී කළ ධර්ම දේශනයන් දී
ගිහිකල නෑදෑයන් බොහෝ දෙනෙකුට නිවනෙහි දොර ඇර දුන්සේක.
නන්ද කුමරු බුදු හිමියන් ගිහිකල සහෝදරයා ය. කුඩා මව් දේවියගේ පුතණුවන් ය. මේ කුමරුගේ ඔටුණු පැළඳවීමේ මංගල්‍යය, විවාහ මංගල්‍යය, රජ මැදුරට පිවිසීමේ මංගල්‍යය, යන ම"ල් සියල්ලම එකම දිනයකට යෙදී තිබුණි. විවාහ ගිවිස ගෙන සිටියේ රූසිරින් අගපත් ජනපද කළ්‍යාණී කුමරිය සමග ය. නන්ද කුමරුගේ සිත සිය පෙම්වතිය කෙරෙහි ද, ජනපද කළ්‍යාණී කුමරිගේ සිත සිය පෙම්වතා කෙරෙහි ද තදින් බැදී පැවතිණි.

බුදුහිමියන්ගේ ඉල්ලීමෙන් නන්ද කුමරු පැවිදි විය. එහෙත් ඒ කැමැත්තකින් නොවේ. ජනපද කළ්‍යාණී කුමරියද සිය පෙම්වතාගේ පැමිණීම නිතර පැතී ය. පෙම් වියෝව නිසා නන්ද හිමි සසුනේ නොඇලී සිවුරු හරිනට සූදානම් විය. එය බුදුරදුනටද සැල විය. දිනක් බුදුහිමියන් නන්ද හිමි සමග තව්තිසා දෙව්ලොවට යාමට පිටත් විය. රාග ගින්නෙන් දැවෙන සිතට අවබෝධය ලබා දීම පිණිස ගමන අතරමග ඉදිරියෙන් ගිනිගත් හේනක දා ගිය වැදිරියකගේ රුව දැක්වුයේ ය.

තව්තිසා දෙව්ලොවදී නන් විසිතුරු රූසිරින් දිලෙන සිය ගණන් දෙවඟනන් දැක්වුයේ ය. නන්ද හිමි ඔවුනගේ රූසිරි දැක පුදුම විය. පසුව බුදුහිමියෝ නන්දයෙනි, වඩාත් ලසසන මේ දෙවඟනන්ද, ජනපද කළ්‍යාණිය දැයි ඇසූහ. මොවුන් දෙස බලන කළ ජනපද කළ්‍යාණී මෙහි අප එද්දී මඟ දුටු දා ගිය වැඳිරිය වැනිය, පවසා අවබෝධය ලබා තමාගේ රාග සිතට නින්දා කොට, පිළිකුල් කොට, භාවනා වඩා රහත් වූහ. එය නිමිති කොට බුදුපියාණන් වහන්සේ, භාවනා වශයෙන් නොවැ- සිත රාගය විනිවිද යන බවද, භවනාවේන් හොඳට වඩා පුරුදු වූ සිත රාගය විනිවිද නොයන බවද වදාළ සේක.

### අට විසි බුද්ධ පූජාවක්

යුරෝක් දහම් නිකේතනය

යුරෝක් දහම් නිකේතන විහාරවාසී පූජ්‍ය අකුරුමුල්ලේ සෝහිත ස්වාමින් වහන්සේ ගේ ඕස්ට්‍රේලියාවේ පුරා අවුරුදු දෙකක ධර්ම සහ ශාසනික සේවය නිමවා නැවත ශ්‍රී ලංකාව බලා වැඩම කිරීම නිමිත්තෙන් උන් වහන්සේට සෙත් පතා අට විසි බුද්ධ පූජාවක් යුරෝක් දහම් නිකේතන විහාරස්ථානයේදී 2006 ජුනි මස 25 ඉරු දින සවස 6.00 ට පැවැත්වෙන බව විහාරස්ථානය ශාසනාලයෙන් දැනුම් දෙයි.

(වැඩි විස්තර සඳහා දහම් නිකේතනය 93334848)